(b) ණයට ගත් මුදල ද මාසික පොලී අනුපාතිකය ද දී ඇති විට,
(i) දෙන ලද මාස ගණනකට අදාළ පොලිය ගණනය කරයි.
(ii) යම් කිසි කාලයකට පසු ණයෙන් නිදහස් වීමට ගෙවිය යුතු මුදල දුන් විට එම කාල සීමාව ගණනය කරයි.

2. (a) ගණිත කර්ම තුනක් ඇතුළත් භාග සහිත ප්‍රකාශනයක් සුළු කරයි.
(b) (i) දෙන ලද සංඛ්‍යා රටාවක පොදු පදය ගොඩ නගයි.
(ii) එම රටාවේ නම් කරන ලද පදයක අගය සොයයි.
(iii) ඉහත රටාවේ පදයක අගය දී ඇති විට එය කී වෙනි පදය දැයි තීරණය කරයි.

3. හරස්කඩ සෘජුකෝණී ත්‍රිකෝණයක් වූ ප්‍රිස්මයක, හරස්කඩ ත්‍රිකෝණයේ කර්ණයේ දිග සහ තවත් එක් පාදයක දිග ද ප්‍රිස්මයේ දිග අඥාතයකින් ද දී ඇති විට,
(i) ත්‍රිකෝණාකාර හරස්කඩෙහි ඉතිරි පාදයේ දිග ගණනය කරයි.
(ii) හරස්කඩ වර්ගඵලය ගණනය කරයි.
(iii) ප්‍රිස්මයේ පෘෂ්ඨ වර්ගඵලය සඳහා අඥාතය අඩංගු ප්‍රකාශනයක් ගොඩ නගයි.
(iv) ප්‍රිස්මයේ පරිමාව දෙන ලද ප්‍රකාශනයකට සමාන බව පෙන්වයි.

4. පැන්සල, කවකටුව, සරල දාරය සහ cm/mm පරිමාණයක් භාවිත කරමින්,
(i) දෙන ලද දිගක් සහිත රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරයි.
(ii) නම් කරන ලද ලක්ෂ්‍යයක දී $60^0$ක කෝණයක් නිර්මාණය කරයි.
(iii) එම රේඛාව මත නම් කරන ලද දිශාවට දෙන ලද දිගක් ලකුණු කර, එය තවත් ලක්ෂ්‍යයක් සමග යා කරමින් ත්‍රිකෝණයක් සම්පූර්ණ කරයි.
(iv) අඳින ලද ත්‍රිකෝණයේ ලක්ෂණ අනුව එය කුමන වර්ගයේ ත්‍රිකෝණයක් දැයි ප්‍රකාශ කරයි.
(v) නම් කරන ලද පාද දෙකක ලම්බ සමච්ඡේදක නිර්මාණය කරයි.
(vi) ඉහත ලම්බ සමච්ඡේදක ඡේදනය වන ලක්ෂ්‍යය කේන්ද්‍රය වූ වෘත්තයක් නිර්මාණය කරයි.
(vii) නිර්මාණය කළ වෘත්තයේ අරය මැන ලියයි.

5. (a) සමාන්තර රේඛා දෙකක් තිර්යක් රේඛාවකින් ඡේදනය වන ලෙස හා වෙනත් තිර්යක් රේඛාවක් එක් සමාන්තර රේඛාවක් ඡේදනය වන ලෙස ද දීඇති රූපයක ,
(i) දී ඇති කෝණයක අගය අනුව නම් කරන ලද කෝණයක අගය හේතු දක්වමින් සොයයි.
(ii) ඒ ඇසුරෙන් නම් කරන ලද තවත් කෝණයක අගය හේතු දක්වමින් සොයයි.
(iii) දෙන ලද කෝණ දෙකක ඓක්‍යය හේතු දක්වමින් සොයයි.

(b) (i) සුදුසු පරිමාණයක් තෝරා ගනිමින් දී ඇති තොරතුරු නිරූපණය කිරීමට පරිමාණ රූපයක් අඳියි.
(ii) අඳින ලද පරිමාණ රූපය ඇසුරින් එක් ස්ථානයක සිට වෙනත් නම් කරන ලද ස්ථානයක අවරෝහණ කෝණය සොයයි.